# 10 ශ්‍රේණිය

# ඉතිහාසය

ක්‍රියාකාරකම් පත්‍රිකා



## ඒකකය 3

## ශ්‍රී ලංකාවේ දේශපාලන බලය විකාශනය වීම -01





## පූර්ව රාජ්‍ය සමය

අයි.එම්.ධම්මික කුමාර ඉලංකෝන් (ගුරු උපදේශක)
කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, කුරුණෑගල

# ශ්‍රී ලංකාවේ දේශපාලන බලය විකාශනය වීම

## පූර්ව රාජ්‍ය සමය

1.ඉතිහාසය පෙල පොත හා මෙම පාඩමට අදාළ කියවීම් පත්‍රිකාව හොඳින් කියවා පහත සඳහන් ක්‍රියාකාරකම් වල නිරත වන්න. නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.

01. ගම් වැව් පද්ධති නිර්මාණය කිරීමේ එක් අරමුණක් වන්නට ඇත්තේ,

1. ජලය සංරක්ෂණය
2. ගංවතුර පාලනය කර ගැනීමය
3. දේශගුණයේ සමබරතාව රැක ගැනීමය.
4. පාංශු ඛාදනය වළක්වා ගැනීමය.

02. මෙවැනි වැව් පද්ධති බහුලව දක්නට ලැබෙන්නේ,

1. තෙත් කලාපයේ ය
2. වියළි කලාපයේ ය
3. කඳුරට තෙත් කලාපයේය
4. පහතරට අතරමැදි තෙත් කලාපයේ ය.

03. කුඩා වැව් පද්ධති භාරව කටයුතු කරන ලද්දේ,

1. මපුරුමුක ය 2. පරුමක ය 3. ගමික ය 4. ගහපති ය

04. පුරාණ ශ්‍රී ලංකාවේ පාලන බලය මුල් මට්ටමේ සිට රාජ්‍යත්වය දක්වා විකාශනය වූ අනුපිළිවෙල දැක්වෙන්නේ කවර පිළිතුරේ ද?

1. ගෘහපති, මපුරුමුකා, ගමික, පරුමක
2. මපුරුමුකා, පරුමක, ගෘහපති, ගමික
3. ගෘහපති, ගමික, පරුමක, මපුරුමුකා
4. පරුමක, ගෘහපති, ගමික, මපුරුමුකා

05. පැරණි ගමක ජීවත් වූ දිළිඳු වැසියෙකු ඊළඟ කන්නයේ ලබා දෙන පොරොන්දුව පිට ඒ ගමේ විසූ ගමිකයාගෙන් වී මල්ලක් ණයට ඉල්ලා ගත් පුවතක් සඳහන් සාහිත්‍ය මූලාශ්‍රය වන්නේ මින් කුමක් ද?

1. සමන්තපාසාදිකාව 2. දීප වංසය 3. ජාතකට්ඨකතාව 4. පූජාවලිය

● පහත සඳහන් ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

01.

I. පහත ප්‍රශ්න වලට පිළිතුරු A ,B, C අනුපිළිවෙළින් ලියා දක්වන්න.
   a. වැඩි දෙනෙකුගේ එකගත්වයෙන් තෝරාගත් පාලකයා හඳුන්වන්නේ කෙසේ ද?
   b. විජය කුමරු ලංකාවට පැමිණෙන අවධිය වන විට ලංකාවේ කෘෂිකාර්මික සමාජයක් දියුණු වෙමින් පැවති බවට සාධක හමුවන පැරණි සොහොන් බිම් දෙකක් නම් කරන්න.

II. ගමික වරයාට අයත් වගකීම් යුතුකම් 04 ක් නම් කරන්න.

III. පැරණි ජනයා ගම් වැව් ඉදිකිරීමට බලපෑ හේතු දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

IV. වැව් පද්ධතියක් යනු කුමක් ද යන්න හඳුන්වා ගම් වැව් පද්ධති ඉදිකිරීමේ අරමුණු කෙටියෙන් විස්තර කරන්න.